මාර්ග සංවර්ධන අධිකාරිය
வீதி அபிவிருத்தி அதிகாரசபை
Road Development Authority

"මගනෙගුම මහ මැදුර", ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, කොස්වත්ත, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.

"மகநெகும மஹாமெதுர" டெனசில் கொப்பேகடுவ மாவத்தை, கொஸ்வத்தை, பத்தரமுல்லை, இலங்கை.

"Maganeguma Mahamedura", Denzil Kobbedaduwa Mawatha, Koswatta, Battaramulla, Sri Lanka.

මගේ අංකය / எனது இல. / My No. RDA/ADB/PAEHP/

ඔබේ අංකය / உமது இல. / Your No. .....

දිනය / திகதி / Date 23.11.2026

නව කැලණි පාලම සහ වරාය පිවිසුම් ගුවන් අධිවේගී මාර්ගය අතර සම්බන්ධක කොටස ඉදිකිරීමේ කටයුතු හේතුවෙන් ඉහුරුකඩේ අන්තර් හුවමාරුවේ පිවිසුම් හා පිටවීමේ මාර්ග තාවකාලිකව වසා තැබීම පිළිබඳ මහජන නිවේදනය රජයේ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම.

නව කැලණි පාලම (New Kelani Bridge – NKB) සහ වරාය පිවිසුම් ගුවන් අධිවේගී මාර්ගය (Port Access Elevated Highway – PAEH) අතර සම්බන්ධක කොටස ඉදිකිරීමේ කටයුතු මේ වන විට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් ක්‍රියාත්මක කරනු ලබයි.

එම ඉදිකිරීම් කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීමේ අරමුණින්, 2026 නොවැම්බර් මස 23 වන දින සිට දෙසැම්බර් මස 01 වන දින දක්වා විවිධ කාලසීමාවන් තුළ ඉහුරුකඩේ අන්තර් හුවමාරුවේ පිවිසුම් හා පිටවීමේ මාර්ග තාවකාලිකව වසා තැබීමට නියමිතය. ඊට අදාළ දින, වේලාවන් සහ විකල්ප මාර්ග පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු පහත දක්වා ඇත.

දිනය	දවස	වේලාව	තාවකාලිකව වසා තැබෙන මාර්ගය
2026 නොවැම්බර් 23	සඳුදා	නොවැම්බර් 23 රාත්‍රී 9.00 සිට නොවැම්බර් 25 පෙ.ව. 5.00 දක්වා	නව කැලණි පාලම (NKB) – කටුනායක සහ ඔරුගොඩවත්ත දෙසින් වරාය / ඉහුරුකඩේ මංසන්ධිය දෙසට පිටවීමේ හා වරාය / ඉහුරුකඩේ මංසන්ධිය දෙසින් කටුනායක සහ බොරැල්ල දෙසට පිවිසීමේ මාර්ග
2026 නොවැම්බර් 24	අඟහරුවාදා (පොහොය දිනය)		
2026 නොවැම්බර් 25	බදාදා	රාත්‍රී 9.00 සිට පසුදින පෙ.ව. 5.00 දක්වා	නව කැලණි පාලම (NKB) – කටුනායක සහ ඔරුගොඩවත්ත දෙසින් වරාය / ඉහුරුකඩේ මංසන්ධිය දෙසට පිටවීමේ මාර්ගය
2026 නොවැම්බර් 26	බ්‍රහස්පතින්දා		
2026 නොවැම්බර් 27	සිකුරාදා		
2026 නොවැම්බර් 28	සෙනසුරාදා	නොවැම්බර් 28 රාත්‍රී 9.00 සිට දෙසැම්බර් 01 පෙ.ව. 5.00 දක්වා	නව කැලණි පාලම (NKB) – කටුනායක සහ ඔරුගොඩවත්ත දෙසින් වරාය / ඉහුරුකඩේ මංසන්ධිය දෙසට පිටවීමේ හා වරාය / ඉහුරුකඩේ මංසන්ධිය දෙසින් කටුනායක සහ බොරැල්ල දෙසට පිවිසීමේ මාර්ග
2026 නොවැම්බර් 29	ඉරිදා		
2026 නොවැම්බර් 30	සඳුදා		

ඒ අනුව, කටුනායක/මහනුවර දෙසින් ඉහුරුකඩේ මංසන්ධිය / කොළඹ වරාය දෙසට ගමන් කරන වාහන පැලියගොඩ හෝ ඔරුගොඩවත්ත පිටවීම් භාවිත කළ යුතුය. ඔරුගොඩවත්ත දෙසින් කොළඹ වරාය/ ඉහුරුකඩේ මංසන්ධිය වෙත ගමන් කරන වාහන නව කැලණි පාලම ප්‍රදේශයේ බිම් මට්ටමේ මාර්ගය භාවිත කළ යුතුය. කොළඹ වරාය/ ඉහුරුකඩේ මංසන්ධි සිට කටුනායක දෙසට ගමන් කරන වාහන නව කැලණි පාලම ප්‍රදේශයේ බිම් මට්ටමේ මාර්ගය ඔස්සේ පැලියගොඩ පිවිසුමද, බොරැල්ල දෙසට දිවෙන වාහන නව කැලණි පාලම ප්‍රදේශයේ බිම් මට්ටමේ මාර්ගයද භාවිත කළ යුතුය.

Telephones:-

Chairman 2862767, Director General 2862795, Working Director 2887257, General Number : 94-11-2046200
Additional Director Generals {Projects 2862485, AO&M 2864804, CD 2882194, NP 2886923}
Directorates {Administration 2865245, Construction 2864388, Engineering Services 2864803, EO&M 038-2291373, ESD 2187165
Finance 2864799, Highway Designs 2874024, Internal Audit 2872661, Lands 2889350 Legal 2186044, Mechanical 2872273
MM 2882196, Planning 2882995, Procurement 2886863, QA&PM 2887235, R&D 2632649 Rural Bridges 2623896, Training 2869342}

මෙම තාවකාලික මාර්ග වසා තැබීම හේතුවෙන් විශේෂයෙන් කොළඹ වරාය වෙත පිවිසෙන සහ ඉන් පිටවන රථවාහන ගමනාගමනයට බලපෑම් ඇති විය හැකි බැවින්, අදාළ මාර්ග වසා තැබීමේ කාලසීමාවන් සහ විකල්ප මාර්ග භාවිතය පිළිබඳව මහජනතාව සහ රියදුරන් කල්වේලා ඇතිව දැනුවත් කිරීම අත්‍යවශ්‍ය වේ.

ඒ අනුව, මහජනතාවට සිදුවිය හැකි අපහසුතා අවම කර ගැනීමේ අරමුණින්, මෙම නිවේදනය රජයේ මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය ඔස්සේ හැකි ඉක්මනින් ප්‍රචාරය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ කාරුණික සහයෝගය හා මැදිහත්වීම බෙහෙවින් අගය කොට සලකමි.

ඉංජි. එච්. එච්. එන්. ඒ. හෙට්ටිආරච්චි,
අධ්‍යක්ෂ ජනරාල්,
මාර්ග සංවර්ධන අධිකාරිය.

DEMOCRATIC SOCIALIST REPUBLIC OF SRI LANKA
MINISTRY OF TRANSPORT, HIGHWAYS AND URBAN DEVELOPMENT

ROAD DEVELOPMENT AUTHORITY

PUBLIC NOTICE

The General Public is hereby informed that, due to the construction works of the merging section between **New Kelani Bridge (NKB)** and **Port Access Elevated Highway (PAEH)**, both **Entry and Exit ramps of Ingurukade Interchange** will be closed from time to time as shown below.

Date	Day	Time	Proposed Road Closure
23 Nov 2026	Monday	From 9:00 pm 23 Nov to 5:00 am on 25 Nov	New Kelani Bridge (NKB) – **Exist ramp** for traffic coming from the Katunayake and Orugodawatta directions towards the Port / Ingurukade Junction. **Entry ramp** for traffic coming from Port / Ingurukade Junction towards Katunayake and Borella directions.
24 Nov 2026	Tuesday – Poya Day		
25 Nov 2026	Wednesday	9:00 pm each day to 5:00 am the following day	New Kelani Bridge (NKB) – **Exist ramp** for traffic coming from the Katunayake and Orugodawatta directions towards the Port / Ingurukade Junction.
26 Nov 2026	Thursday		
27 Nov 2026	Friday		
28 Nov 2026	Saturday	From 9:00 pm on 28 Nov to 5:00 am on 1 Dec	New Kelani Bridge (NKB) – **Exist ramp** for traffic coming from the Katunayake and Orugodawatta directions towards the Port / Ingurukade Junction. **Entry ramp** for traffic coming from Port / Ingurukade Junction towards Katunayake and Borella directions.
29 Nov 2026	Sunday		
30 Nov 2026	Monday		

As such vehicles towards Ingurukade Junction/Port from Katunayake/ Kandy direction to be exit at Paliyagoda or Orugodawatta exists. The vehicles towards Port from Orgodawatta has to be used on the ground level road at NKB. The vehicles coming from Ingurukade Junction/Port towards Katunayake should use the Entry at Peliyagoda after coming through the ground level road at NKB. The vehicles coming from Ingurukade Junction/Port towards Borella should use the ground level road at NKB.

Regret any inconvenience caused to the Public.

Director General,
Road Development Authority,
"Maganeguma Mahamedura",
No: 216, Denzil Kobbekaduwa Mawatha,
Koswatta, Battaramulla

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය

ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යාංශය

මාර්ග සංවර්ධන අධිකාරිය

මහජන නිවේදනය

නව කැලණි පාලම (NKB) සහ වරාය පිවිසුම් ගුවන් අධිවේගී මාර්ගය (PAEH) සම්බන්ධ වන කොටසේ ඉදිකිරීම් කටයුතු හේතුවෙන්, ඉඟුරුකඩේ අන්තර් හුවමාරුවේ පිවිසුම් සහ පිටවීමේ මාර්ග පහත සඳහන් කාලසටහන අනුව වරින් වර තාවකාලිකව වසා තැබෙන බව මහජනතාව වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

දිනය	දවස	වේලාව	තාවකාලිකව වසා තැබෙන මාර්ගය
2026 නොවැම්බර් 23	සඳුදා	නොවැම්බර් 23 රාත්‍රී 9.00 සිට නොවැම්බර් 25 පෙ.ව. 5.00 දක්වා	නව කැලණි පාලම (NKB) – කටුනායක සහ ඔරුගොඩවත්ත දෙසින් වරාය / ඉඟුරුකඩේ මංසන්ධිය දෙසට පිටවීමේ හා වරාය / ඉඟුරුකඩේ මංසන්ධිය දෙසින් කටුනායක සහ බොරැල්ල දෙසට පිවිසීමේ මාර්ග
2026 නොවැම්බර් 24	අඟහරුවාදා (පොහොය දිනය)		
2026 නොවැම්බර් 25	බදාදා	රාත්‍රී 9.00 සිට පසුදින පෙ.ව. 5.00 දක්වා	නව කැලණි පාලම (NKB) – කටුනායක සහ ඔරුගොඩවත්ත දෙසින් වරාය / ඉඟුරුකඩේ මංසන්ධිය දෙසට පිටවීමේ මාර්ගය
2026 නොවැම්බර් 26	බ්‍රහස්පතින්දා		
2026 නොවැම්බර් 27	සිකුරාදා		
2026 නොවැම්බර් 28	සෙනසුරාදා	නොවැම්බර් 28 රාත්‍රී 9.00 සිට දෙසැම්බර් 01 පෙ.ව. 5.00 දක්වා	නව කැලණි පාලම (NKB) – කටුනායක සහ ඔරුගොඩවත්ත දෙසින් වරාය / ඉඟුරුකඩේ මංසන්ධිය දෙසට පිටවීමේ හා වරාය / ඉඟුරුකඩේ මංසන්ධිය දෙසින් කටුනායක සහ බොරැල්ල දෙසට පිවිසීමේ මාර්ග
2026 නොවැම්බර් 29	ඉරිදා		
2026 නොවැම්බර් 30	සඳුදා		

ඒ අනුව, **කටුනායක/මහනුවර** දෙසින් **ඉඟුරුකඩේ මංසන්ධිය / කොළඹ වරාය දෙසට** ගමන් කරන වාහන **පැලියගොඩ හෝ ඔරුගොඩවත්ත** පිටවීම භාවිත කළ යුතුය. **ඔරුගොඩවත්ත දෙසින් කොළඹ වරාය/ ඉඟුරුකඩේ මංසන්ධිය වෙත** ගමන් කරන වාහන **නව කැලණි පාලම ප්‍රදේශයේ බිම් මට්ටමේ මාර්ගය** භාවිත කළ යුතුය. **කොළඹ වරායේ සිට කටුනායක දෙසට** ගමන් කරන වාහන **නව කැලණි පාලම ප්‍රදේශයේ බිම් මට්ටමේ මාර්ගය** ඔස්සේ **පැලියගොඩ පිවිසුමද, බොරැල්ල** දෙසට දිවෙන වාහන **නව කැලණි පාලම ප්‍රදේශයේ බිම් මට්ටමේ මාර්ගයද** භාවිත කළ යුතුය.

මෙම කාලසීමාව තුළ ස්ථාපිත කර ඇති තාවකාලික රථවාහන සංඥා, දිශා පුවරු සහ පොලිස් නිලධාරීන්/බලයලත් නිලධාරීන් විසින් ලබාදෙන උපදෙස් පිළිපදින ලෙස සියලුම මාර්ග භාවිත කරන්නන්ගෙන් කාරුණිකව ඉල්ලා සිටිමු.

මේ හේතුවෙන් මහජනතාවට සිදුවන අපහසුතාව පිළිබඳව කනගාටුව පළ කරමු.

අධ්‍යක්ෂ ජනරාල්,
මාර්ග සංවර්ධන අධිකාරිය,
"මගනැගුම මහමැදුර",
අංක 216, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල